SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 34 S I |
|---|---|---|

## විද්‍යාව I

කාලය පැය දෙකයි

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

### I කොටස

01. ශාකයක ප්‍රධාන කොටස් හඳුනා ගැනීම සඳහා වියළා, තෙරපා ක්ෂේත්‍ර පොතේ ඇලවීමට වඩාත් සුදුසු ශාකය තෝරන්න.
   1. අඹ ශාකය 2. කුප්පමේනිය ශාකය 3. එළබටු ශාකය 4. ක්‍රෝටන් ශාකය

02. දකුණු පසින් ඇති රූපයේ දැක්වෙන ශාකයේ පැවතිය **නොහැකි** ලක්ෂණය කුමක් විය හැකිද?
   1. මුදුන් මුලක් පැවතීම.
   2. කඳ අතු බෙදී තිබීම.
   3. බීජයේ පියලි දෙකක් තිබීම.
   4. පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසයක් තිබීම.



03. චලනය මගින් විද්‍යුතය නිපදවන විද්‍යුත් ප්‍රභවය පහත සඳහන් පිළිතුරු අතරින් කුමක්ද?
   1. සූර්ය කෝෂය 2. වියලි කෝෂය
   3. සරල කෝෂය 4. බයිසිකල් ඩයිනමෝව

04. ප්‍රත්‍යාවර්ත විදුලි ධාරාවක් භාවිත කර ක්‍රියාත්මක කරන උපකරණය කුමක්ද?
   1. බිත්ති ඔරලෝසුව 2. සෙල්ලම් මෝටර් රථය
   3. පාපැදියක ප්‍රධාන ලාම්පුව 4. ජංගම දුරකථනය

05. අම්ල භෂ්ම සමග වෙනස් වර්ණ ලබා දෙන ද්‍රව්‍ය හඳුන්වන්නේ,
   1. දර්ශක ලෙස ය. 2. ලවණ ලෙස ය. 3. අම්ල ලෙස ය. 4. භෂ්ම ලෙස ය.

06. මෙම ශාකයේ අතුවලින් හටගෙන පහළට වර්ධනය වී ඇති මුල්වලින් ඉටුවන කාර්යයක් වනුයේ,
   1. කඳට ආධාරකයක් ලෙස ක්‍රියාකිරීම.
   2. අතුවලට ආධාරකයක් ලෙස ක්‍රියාකිරීම.
   3. වායුගෝලයෙන් ඛනිජ ලවණ අවශෝෂණය
   4. සංචිත මුල් ලෙස ක්‍රියාත්මක වීම.



07. පුෂ්පවල පැවතිය හැකි ලක්ෂණ කීපයක් පහත දැක්වේ. ඒවා අතරින් රාත්‍රි පිපෙන පුෂ්පවල දැකිය හැක්කේ කවර ලක්ෂණ දැයි තෝරන්න.

| | |
|---|---|
| A. සුදුපාට වීම | B. සුගන්ධවත් වීම |
| C. දළ පත්‍ර නොපිහිටීම | |

   1. A පමණි. 2. B හා C පමණි. 3. A හා B පමණි. 4. A, B හා C සියල්ලමය.

08. දිවියාගේ ශරීරය දුවිලි පැහැති වීම සහ පුල්ලි පිහිටීම නිසා වෙනත් සතුන්ට වඩාත් පහසුවෙන් හඳුනා ගත නොහැකිවේ. මෙසේ පරිසරයට අනුවර්තනය වී තිබීම හඳුන්වන්නේ,
   1. පර්යටනය ලෙස ය. 2. වේශාන්තරය ලෙස ය. 3. රූපාන්තරණය ලෙස ය. 4. කාලතරණය ලෙස ය.

09. ස්ථිති විද්‍යුතය භාවිතයට ගන්නා අවස්ථාව විය හැක්කේ,
   1. විදුලි පංකාවක් ක්‍රියාත්මක වීම. 2. ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාත්මක වීම.
   3. ආලෝක විමෝචන ඩයෝඩයක් දැල්වීම. 4. සූර්ය කෝෂයක් ක්‍රියාත්මක වීම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

10. පුෂ්පයක නිරීක්ෂණය කළ හැකි ව්‍යුහයක් රූපයේ දැක්වේ. එහි A, B, C යනු පිළිවෙලින්,
1. කලංකය, කීලය, ඩිම්බකෝෂය
2. කලංකය, ඩිම්බකෝෂය, කීලය
3. කීලය, කලංකය, ඩිම්බකෝෂය
4. කලංකය, සූත්‍රිකාව, ඩිම්බකෝෂය




11. දෙහියුෂ, විනාකිරි, සබන් දියර හා හුණු දියර මිලි ලීටර් 2 බැගින් පරීක්ෂණ නළවලට ගන්න. ඒවාට රතු වද මල් තම්බා ලබා ගත් යුෂ ස්වල්පය බැගින් එකතු කරයි. එවිට දැකිය හැකි නිවැරදි නිරීක්ෂණය වනුයේ,
1. විනාකිරි රතුපාට වීම
2. දෙහියුෂ නිල්පාට වීම
3. සබන් දියර කහ පාට වීම
4. හුණු දියර අවර්ණ වීම.

12. කුඩා විදුලි පන්දම් බල්බයක් සවි කළ සරල කෝෂයක් සම්බන්ධව සත්‍ය ප්‍රකාශය කුමක්ද?
1. ඍණ අග්‍රය ලෙස තඹ තහඩුව ක්‍රියාත්මක වේ.
2. බල්බය නිවී නිවී දැල්වෙමින් පවතී.
3. සල්ෆියුරික් අම්ලය ක්‍රමයෙන් රතු පැහැයට හැරේ.
4. සින්ක් තහඩුව දියවේ.

13. නිල් ලිට්මස් දැමූ විට සමාන වර්ණ වෙනස්වීමක් පෙන්වන ද්‍රව්‍ය **පමණක්** ඇති පිළිතුර තෝරන්න.
1. ජලය, හයිඩ්‍රොක්ලෝරික්, දෙහි යුෂ
2. දෙහි යුෂ, විනාකිරි, තක්කාලි යුෂ
3. හයිඩ්‍රොක්ලෝරික්, සබන් දියර, ශල්‍ය ස්ප්‍රීතු
4. සබන් දියර, ශල්‍ය ස්ප්‍රීතු, ජලය

14. භස්ම ද්‍රාවණයකට පිනෝප්තලින් බිංදුවක් දැමූ විට සිදුවන වර්ණ විපර්යාසය වනුයේ,
1. අවර්ණ වීම ය.
2. කහපාට වීම ය.
3. රෝසපාට වීම ය.
4. නිල්පාට වීම ය.

15. විටමින්, ඛනිජ ලවණ, ඖෂධ වැනි දෑ, අප සිරුරේ, අවශ්‍ය ස්ථානවලට පරිවහනය කරන්නේ රුධිරය මගිනි. මෙහිදී රුධිරයේ ඇති ජලය ක්‍රියාකරන්නේ,
1. ද්‍රාවකයක් ලෙසය.
2. සිසිලන කාරකයක් ලෙසය.
3. මාධ්‍යයක් ලෙසය.
4. පරිවාරකයක් ලෙසය.

16. සතුන්ගේ දක්නට ලැබෙන ආරක්ෂක චර්යා උපාය මාර්ගයක් **නොවන්නේ,**
1. හූණා වලිගය කඩාදැමීම.
2. ඉබ්බා කටුව තුළට රිංගා ගැනීම.
3. පලා පොළඟා හැව හැරීම.
4. ඇහැටුල්ලා කොළ පැහැති පඳුරු අතර සිටීම.

17. පියඹා යාම යන සංචරණ ක්‍රමය පදනම් කරගත් ක්ෂීරපායි සතෙකු විය හැක්කේ,
1. වවුලාය.
2. සමනලයාය
3. කපුටාය.
4. බත් කූරාය.

18. ජලයේ හොඳින් දියවෙන ද්‍රව්‍යය ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ග්ලූකෝස්, කොන්ඩිස් කැට, නිල්කුඩු
2. භූමිතෙල්, පොල්තෙල්, ලුණු
3. ආප්ප සෝඩා, කහ කුඩු, විනාකිරි
4. ශල්‍ය සප්‍රීතු, ලුණු, විනාකිරි

19. වියළි කෝෂ දෙකකට ආලෝක විමෝචක ඩයෝඩ දෙකක් සවිකර ඇති අවස්ථාවක් පහත දැක්වේ. නිවැරදි නිරීක්ෂණය සහිත වරණය තෝරන්න.




1. LED දෙකම දැල්වේ.
2. LED දෙකම නොදැල්වේ.
3. LED - 1 දැල්වේ. LED - 2 නොදැල්වේ.
4. LED - 1 නොදැල්වේ. LED - 2 දැල්වේ.

20. විද්‍යා ගුරුතුමා විසින් සකස් කරන ලද සරල විද්‍යුත් ප්‍රභවයක් පහත දැක්වේ.




මැද බින්දු ගැල්වනෝමීටරයේ නිරීක්ෂණයක් ලබාගැනීමට කඩදාසිය පෙඟ වීමට සුදුසු ද්‍රව්‍යය වන්නේ,
1. භූමිතෙල්
2. ආසුත ජලය
3. ශල්‍ය සප්‍රීතු ද්‍රාවණය
4. විනාකිරි ද්‍රාවණය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

21. අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. සේද වලින් පිරිමදින ලද වීදුරු දණ්ඩට ධන ආරෝපණයක් ලැබේ.
   2. ලෝම වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩට ධන ආරෝපණයක් ලැබේ.
   3. ලෝම වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩට සෘණ ආරෝපණයක් ලැබේ.
   4. සේද වලින් පිරිමදින ලද PVC දණ්ඩට සෘණ ආරෝපණයක් ලැබේ.

22. පහත දැක්වෙන්නේ ඵල තුනක රූප සටහන්ය.




මේවා ව්‍යාප්ත වන නිවැරදි ක්‍රම ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
1. සුළඟ, සතුන්, ජලය   2. සුළඟ, ජලය, සතුන්   3. සතුන්, ජලය, සුළඟ   4. ජලය, සතුන්, සතුන්

23. පත්‍ර තලය නොබෙදුණු හා බෙදී ඇති ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| පිළිතුරු අංකය | පත්‍ර තලය බෙදී නොමැති ශාකයකි | පත්‍ර තලය අර්ධ ලෙස බෙදී ඇති ශාකයකි | පත්‍ර තලය සම්පූර්ණයෙන් බෙදී ඇති ශාකයකි |
|---|---|---|---|
| 1. | මුරුංගා | පැපොල් | කරපිංචා |
| 2. | බුලත් | මෑ | මඤ්ඤොක්කා |
| 3. | අඹ | දෙල් | පොල් |
| 4. | හබරල | බතල | තල් |

24. කුඩා ප්‍රමාණයේ ඉරටු කැබලි සියයක් පමණ රතු, කොළ, කහ, දුඹුරු වර්ණ වලින් වර්ණ ගන්වා ගනු ලැබේ. තණකොළ සහිත පිට්ටනියක සීමිත කොටසක මේවා විසුරුවා හරියි. ළමුන් දෙදෙනෙකුට සීමිත කාලයක් තුළදී හැකිතාක් මෙම ඉරටු කැබලි ඇහිදීමට යොමු කරයි. අවසානයට ළමුන් ඇහිදීම සිදු කරන්නේ කවර වර්ණයේ ඉරටු කැබලිද?
1. කොළ පාට ඉරටු   2. කහ පාට ඉරටු   3. රතු පාට ඉරටු   4. දුඹුරු පාට ඉරටු

25. පහත සඳහන් වන්නේ සිසු දරුවෙක් වේශාන්තරයේ වාසි ලියා තිබූ ආකාරයයි.
   A. විලෝපියන්ට පහසුවෙන් දර්ශනය නොවී ආරක්ෂා වීමට.
   B. ගොදුරු පහසුවෙන් සොයා ගැනීමට.
   C. ඉතා වේගවත් සංචරණයක් සිදු කිරීමට.

මේවා අතරින් නිවැරදි පිළිතුරු මොනවාද?
1. B හා C පමණි.   2. A හා C පමණි.   3. A හා B පමණි.   4. A,B,C සියල්ලම.

* * * * *

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

## II කොටස

උපදෙස් :

- පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සපයන්න. ඉතිරි ප්‍රශ්න 05 න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට වෙනම කඩදාසි භාවිත කරන්න.)
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

01) 7 වන ශ්‍රේණියේ සිසුන් පිරිසක් ක්ෂේත්‍ර චාරිකාවක දී හඳුනා ගත් ශාක කිහිපයක් සහ එම ශාක සංඛ්‍යාව පහත ස්ථම්භ ප්‍රස්තාරයෙන් දක්වා ඇත.




මෙම ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) i. ක්ෂේත්‍ර චාරිකාවේ දී වැඩිපුර ම හමු වූ ශාකය කුමක්ද? (ල. 01)

ii. අතු නොබෙදුණු කඳක් සහිත ශාකයක් ලියන්න. (ල. 01)

iii. සංයුක්ත පත්‍ර සහිත ශාකයක් ලියන්න. (ල. 01)

iv. පුෂ්ප හට නොගන්නා ශාකය කුමක්ද? (ල. 01)

v. මූල ගැටිති සහිත ශාකය නම් කරන්න. (ල. 01)

vi. ජලය මගින් බීජ ප්‍රචාරණය වීමට අනුවර්තන දක්වන ශාක මෙහි දී හමුවිය. එම ශාකයක් නම් කරන්න. (ල. 01)

vii. මෙහි ඇති ඒක බීජ පත්‍රී ශාක කුමක් ද? (ල. 01)

viii. සුළඟ මගින් ප්‍රචාරණය වන බීජ සහිත ශාකය හා එය, ඒ සඳහා දක්වන අනුවර්තනය කුමක්ද? (ල. 02)

(ආ)




රූපයේ දැක්වෙන්නේ පුෂ්පයක පුමාංගී කොටස යි.

i. මෙහි කෘත්‍යය කුමක්ද? (ල. 01)

ii. මෙහි $x$ හා $y$ කොටස් දෙක නම් කරන්න. (ල. 01)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

02) (අ) මුහුදු වෙරළ ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරතවූ සිසුන් පිරිසකට හමුවූ සතුන් කිහිප දෙනෙක් පහත දැක්වේ.

| |
|---|
| මුහුදු ලිහිණියා, සාලයා, කැස්බෑවා<br>මුහුදු බෙල්ලා, මුහුදු මල |

i. ඉහත සතුන්ගේ බාහිර ලක්ෂණ පමණක් උපයෝගි කරගෙන දෙබෙදුම් සුචියකින් වර්ග කිරීමට ගත් උත්සාහයක් පහත දැක්වේ. එහි හිස්තැන් වලට අදාළ පිළිතුර සඳහන් කරන්න.




(ල. 04)

ii. මුහුදු බෙල්ලා සහ මුහුදු මල වෙන් කිරීමට සුදුසු, ඉහත දෙබෙදුම් සුචියේ **නොමැති** බාහිර ලක්ෂණයක් ලියන්න. (ල. 01)

iii. දෙබෙදුම් සුචියට ඇතුළත් කර ඇති සතුන් අතරින් අපෘෂ්ඨවංශි සත්ත්වයින් දෙදෙනෙකු ලියන්න. (ල. 01)

iv. මුහුදු ලිහිණියා ජීවත්වන පරිසරයට දක්වන අනුවර්තනයක් ලියන්න (ල. 01)

v. මුහුදු බෙල්ලාගේ ආරක්ෂක අනුවර්තනයක් සඳහන් කරන්න. (ල. 01)

vi. දෙබෙදුම් සුචියේ සඳහන් සතුන් අතරින් අනාකූල හැඩයක් දරණ සතුන් දෙදෙනෙකු නම් කරන්න. නම ඉදිරියෙන් එක් එක් සත්ත්වයා හා එම හැඩයෙන් අත්කරගන්නා වාසිය ලියන්න. (ල. 02)

(ආ) සංචරණය සඳහා ශරීර හැඩය වැදගත්වන ආකාරය සොයා බැලීම සඳහා පන්ති කාමරයේ සිදුකළ ක්‍රියාකාරකමක රූපය පහත දැක්වේ.




i. ඉහත A හා B බණ්ඩක්කා ව්‍යුහ දෙකම එකවර අතහැරිය විට වඩා වේගයෙන් ගමන් කරන්නේ කුමන අකාරය දරණ ව්‍යුහයද? (ල. 01)

ii. ඔබ ඉහත I හි සඳහන් කළ පිළිතුරට හේතුව කුමක්ද? (ල. 01)

03) i. ජලය ද්‍රාවකයක්, ශීතකාරයක් (සිසිලන කාරකයක්), ස්නේහකයක් හා මාධ්‍යයක් ලෙස භාවිත කරන අවස්ථා සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල. 02)

ii. බැටරි ඇසිඩ් ලෙස හඳුන්වන්නේ තනුක කරන ලද සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලය යි. මෙහිදී ප්‍රයෝජනවත් වන ජලයේ ගුණය කුමක්ද? (ල. 01)

iii. ග්ලූකෝස්, ඉටි, මැටි, ශල්‍ය ස්ප්‍රීතු, කහ කුඩු, පොල්තෙල් ජලයට දමා හොඳින් කැලතූ විට ජලයේ හොඳින් දියවන, මඳ වශයෙන් දියවන හා ජලයේ දියනොවන ද්‍රව්‍ය එක බැගින් ලියන්න. (ල. 03)

iv. ජලයේ දියවී ඇති දෑ වෙන් කර ගැනීම, ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකකි, ලුණු සහ හකුරු නිපදවීම, ලුණු සහ හකුරු නිපදවා ගන්නේ කෙසේද? (ල. 02)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

v. ජලයේ සිසිලනකාරක ගුණය පරීක්ෂා කිරීමට සැකසූ ඇටවුමක රූපසටහනක් පහත දැක්වේ.




මද වේලාවකින් A හා B බඳුන්වල ඇති උෂ්ණත්වමාන වල දක්නට ලැබෙන වෙනස්කම් වෙන් වෙන්ව ලියන්න. (ල. 02)

vi. ජීවත්වන මාධ්‍යයක් ලෙස ජලය යොදා ගන්නා ක්ෂිරපායි සතෙක් සහ උරගයෙක් නම් කරන්න. (ල. 02)

04) ද්‍රව්‍ය පිරිමැදීමෙන් ස්ථිති විද්‍යුත් අරෝපණ ඇති වේ.

i. ද්‍රව්‍ය පිරිමැදීමෙන් සැහැල්ලු ද්‍රව්‍ය ආකර්ශනය වන බව පෙන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද? (ල. 01)

ii. ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ග දෙකකි ඒවා නම් කරන්න. (ල. 02)

iii. සේද වලින් පිරිමැදීමෙන් වීදුරු දණ්ඩට ලැබෙන ආරෝපණය කුමක් ද? (ල. 01)

iv. සේද වලින් පිරිමදින ලද වීදුරු දණ්ඩක් හා ලොම් වලින් පිරිමදින ලද එබනයිට් දණ්ඩක් ළං කල විට එකිනෙක ආකර්ශනය වූයේ නම් එබනයිට් දණ්ඩේ ආරෝපණ වර්ගය කුමක් ද? (ල. 02)

v. ස්ථිති විද්‍යුත් ආරෝපණ ගබඩා කළ හැකි උපකරණය නම් කරන්න. (ල. 01)

vi. විද්‍යුත් ආරෝපණ මනිනු ලබන ඒකකය කුමක් ද? (ල. 01)

vii. වීදුරු දණ්ඩ හා එබනයිට් දණ්ඩ ලෝම වලින් පිරිමදින ලද්දේ නම්, ඒවා ළං කල විට කුමක් සිදු වේද? (ල. 02)

viii. ස්ථිති විද්‍යුත් ආරෝපණ ප්‍රයෝජනයට ගන්නා උපකරණ දෙකක් නම් කරන්න. (ල. 02)

05) නිවසේ භාවිත කරන බොහෝ ද්‍රව්‍ය මෙන්ම විද්‍යාගාරයේ භාවිත කරන රසායනික සංයෝගද ඒවායේ ගුණ අනුව අම්ල භස්ම හා උදාසීන ලෙස වර්ග කළ හැකිය.

(අ) i. ස්වභාවික පරිසරයේ ඇති ද්‍රව්‍ය යොදා ගෙන අම්ල, භස්ම හා උදාසීන ද්‍රව්‍ය වෙන් කර ගත හැකිය. එවැනි ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ල. 02)

ii. නිවසේ ඇති ආම්ලික ද්‍රව්‍ය 2 ක් ලියන්න. (ල. 02)

(ආ) විද්‍යාගාරයේ *x*, *y* හා *z* ලෙස නම් කර තිබූ දියර වර්ග තුනකට රතු හා නිල් ලිට්මස් කඩදාසි වෙන වෙනම එකතු කළ විට ලැබුණු නිරීක්ෂණ පහත දැක්වේ.

| දියරය | නිල් ලිට්මස් දැමූවිට | රතු ලිට්මස් දැමූවිට |
|---|---|---|
| *x* | වර්ණ වෙනසක් නැත. | නිල් පැහැයට හැරුණි. |
| *y* | වර්ණ වෙනසක් නැත. | වර්ණ වෙනසක් නැත. |
| *z* | රතු පැහැයට හැරුණි. | වර්ණ වෙනසක් නැත. |

i. භාෂ්මික ගුණ දරණ ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)

ii. උදාසීන ලක්ෂණ පෙන්වන ද්‍රව්‍ය කුමක් ද? (ල. 01)

iii. ඉහත දියර තුනට පිනොප්තලින් අවර්ණ ද්‍රාවණය එක් කළ විට රෝස පාටක් ඇතිවන්නේ කුමන දියරය සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන්ද? (ල. 01)

(ඇ) පහත සඳහන් ද්‍රාවණ තුනට වෙන වෙනම pH කඩදාසි කැබලි 3 ක් දමන ලදී.

| |
|---|
| ශල්‍ය ස්ප්‍රීතු ද්‍රාවණය, සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය, ජලීය හයිඩ්‍රෝක්ලෝරික් ද්‍රාවණය |

SLGURU.LK

ලැබෙන නිරීක්ෂණ ඇසුරින් පිළිතුරු ලියන්න.

i. pH කඩදාසියේ 1, 2, 3, 4, 5, 6 ට අදාළ වර්ණයක් ලබා දෙන ද්‍රාවණය කුමක්ද? (ල. 01)

For Educational Purpose Only

SLGURU.LK

ii. pH කඩදාසියේ 8, 9, 10, 11, 12, 13, 14 ට අදාළ වර්ණයක් ලබා දෙන ද්‍රාවණය කුමක් ද? (ල. 01)
iii. pH කඩදාසියේ 7ට අදාළ වර්ණය ලබා දෙන ද්‍රාවණය කුමක්ද? (ල. 01)
iv. පහත සඳහන් අවස්ථාවල දී භාවිත කරන රසායන ද්‍රව්‍ය මොනවා ද? ඉදිරියෙන් ලියා දක්වන්න. (ල. 02)

- මී මැස්සා දෂ්ට කළ විට ආලේප කරන ද්‍රව්‍ය :-
- ආමාශයේ ඇතිවන ගැස්ට්‍රයිටිස් හෙවත් බඩේ දැවිල්ලට විකා ගිලින ද්‍රව්‍ය :-

06) විදුලිය උත්පාදනය කළ හැකි ආකාර දෙකක් පහත දැක්වේ.




A




B

i. චුම්බකය දඟරය වෙත ළංකළ විට මැද බින්දු ගැල්වනෝමීටරයේ සිදුවන වෙනස කුමක්ද? (ල. 01)
ii. චුම්බකය දඟරයෙන් ඉවතට චලනය කරන විට මැද බින්දු ගැල්වනෝමීටරයේ සිදුවන වෙනස ලියන්න. (ල. 01)
iii. ඉහත A පරිපථයේ හටගන්නා විද්‍යුත් ධාරාව කුමන වර්ගයේ විද්‍යුත් ධාරාවක් ද? (ල. 02)
iv. B පරිපථයේ ස්විචය සංවෘත කළ විට LED වල නිරීක්ෂණය කුමක් ද? (ල. 01)
v. ඉහත (iv) හි ඔබ ලබා දුන් පිළිතුරට හේතුව කුමක් ද? (ල. 02)
vi. B පරිපථය තුළ ගලන්නේ කවර වර්ගයේ විදුලි ධාරාවක්ද? (ල. 02)
vii. ඉහත ආකාර දෙකට අමතරව විද්‍යුතය ජනනය කළ හැකි වෙනත් ආකාර දෙකක් ලියන්න. (ල. 02)
viii. A පරිපථයේ පවතින දඟරයේ පොටවල් ගණන වැඩි කළ විට ගැල්වනෝ මීටරයේ සූචකයේ උත්ක්‍රමණයෙහි සිදුවන වෙනස කුමක් ද? (ල. 01)

* * * * *

SLGURU.LK
For Educational Purpose Only

"Education's purpose is to replace an empty mind with an open one." — Malcolm Forbes

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළමු වාර පරීක්ෂණය - 2019
7 ශ්‍රේණිය - විද්‍යාව
පිළිතුරු පත්‍රය

I කොටස

| ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 6 | 2 | 11 | 1 | 16 | 3 | 21 | 2 |
| 2 | 4 | 7 | 3 | 12 | 4 | 17 | 1 | 22 | 1 |
| 3 | 4 | 8 | 2 | 13 | 2 | 18 | 4 | 23 | 3 |
| 4 | 3 | 9 | 2 | 14 | 3 | 19 | 3 | 24 | 1 |
| 5 | 1 | 10 | 1 | 15 | 3 | 20 | 4 | 25 | 3 |

II කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01) | (අ) | i. | | නිදිකුම්බා | 01 |
| | | ii. | | මඩු හෝ පොල් | 01 |
| | | iii. | | නිදිකුම්බා හෝ පොල් | 01 |
| | | iv. | | මඩු හෝ බේඳුරු | 01 |
| | | v. | | නිදිකුබ්බා | 01 |
| | | vi. | | කොට්ටම්බා | 01 |
| | | vii. | | පොල් | 01 |
| | | viii. | | අගුණ වැල් | 01 |
| | | | | බීජය වටා කෙඳි තිබීම. | 01 |
| | (ආ) | i. | | පරාග නිපදවීම | 01 |
| | | ii. | | x - පරාගධානිය y - සූත්‍රිකාව | 02 |
| | | | | | 12 |
| 02) | (අ) | i. | | A - පිහාටු ඇති B - පිහාටු නැති වැනි නිවැරදි පිළිතුරට | 02 |
| | | | | C - මුහුදු බෙල්ලා D - මුහුදු මල | 02 |
| | | ii. | | නිවැරදි පිළිතුරට | 01 |
| | | iii. | | මුහුදු බෙල්ලා, මුහුදුමල | 01 |
| | | iv. | | අනාකුල හැඩයක් ගැනීම | 01 |
| | | v. | | ශක්තිමත් බාහිර ආවරණයක් තිබීම - වැනි නිවැරදි පිළිතුරක් | 01 |
| | | vi. | | නිවැරදි පිළිතුරකට | 02 |
| | (ආ) | i. | | B ව්‍යුහය | 01 |
| | | ii. | | B හි ඇති අනාකුල හැඩය නිසා ජලයේ ගමන් කිරීමේදී ජලයේ ඇතිවන බාධාව/ ප්‍රතිරෝධය පහසුවෙන් ඉවත්වන වැනි නිවැරදි පිළිතුරකට | 01 |
| | | | | | 12 |
| 03) | | i. | | නිවැරදි පිළිතුරු සඳහා | 02 |
| | | ii. | | ද්‍රාවක ගුණය | 01 |
| | | iii. | | නිවැරදි පිළිතුරු වලට | 03 |
| | | iv. | | සූර්ය තාපයෙන් මුහුදු ජලය වාෂ්ප කිරීමෙන් මීරාවල ඇති ජලය කොටසක් වාෂ්ප කිරීම. | 02 |
| | | v. | | A - උෂ්ණත්වමානයේ පාඨාංකය වෙනස් නොවේ. | |
| | | | | B - උෂ්ණත්වමානයේ පාඨාංකය පහළ බසී. | 02 |
| | | vi. | | නිවැරදි පිළිතුරුවලට | 02 |
| | | | | | 12 |
| 04) | | i. | | විලියම් ගිල්බර්ට් | 01 |

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ii. | | ධන ආරෝපණ, සෘණ ආරෝපණ | 02 |
| | | iii. | | ධන ආරෝපණ | 01 |
| | | iv. | | සෘණ ආරෝපණ | 02 |
| | | v. | | ධාරිත්‍රකය | 01 |
| | | vi. | | ෆැරඩ් (F) | 01 |
| | | vii. | | විකර්ශණය වේ. | 02 |
| | | viii. | | ඡායා පිටපත් යන්ත්‍රය, ගුවන් විදුලි යන්ත්‍රය වැනි නිවැරදි පිළිතුරු වලට | 02 |
| | | | | | 12 |
| 05) | (අ) | i. | | වදමල් යුෂ, කටරොළුමල් යුෂ වැනි ගැලපෙන දර්ශක දෙකකට | 02 |
| | | ii. | | දෙහි, විනාකිරි වැනි ද්‍රව්‍ය 2 කට | 02 |
| | (ආ) | i. | | $x$ | 01 |
| | | ii. | | $y$ | 01 |
| | | iii. | | $x$ | 01 |
| | (ඇ) | i. | | ජලීය හයිඩ්‍රොක්ලෝරික් ද්‍රාවණය | 01 |
| | | ii. | | සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය | 01 |
| | | iii. | | ශල්‍ය ස්ප්‍රීතු ද්‍රාවණය | 01 |
| | | iv. | | ආප්ප සෝඩා<br>මිල්ක් ඔෆ් මැග්නීසියා පෙති } | 02 |
| | | | | | 12 |
| 06) | | i. | | සූචකය (කටුව), උත්ක්‍රමණය වැනි නිවැරදි පිළිතුරකට | 01 |
| | | ii. | | සූචකය ප්‍රතිවිරුද්ධ දිශාවට උත්ක්‍රමණය වේ. | 01 |
| | | iii. | | ප්‍රත්‍යාවර්ත විද්‍යුත් ධාරාවක් | 02 |
| | | iv. | | නැත | 01 |
| | | v. | | LED අග්‍ර හා කෝෂ වල අග්‍ර නිවැරදිව සම්බන්ධ වී නොමැති වීම. | 02 |
| | | vi. | | සරල ධාරාවක් | 02 |
| | | vii. | | නිවැරදි පිළිතුරකට (උදාහරණ - සූර්ය කෝෂ) | 02 |
| | | viii. | | උත්ක්‍රමණය වන ප්‍රමාණය වැඩිවේ. | 01 |
| | | | | | 12 |

SLGURU.LK
For Educational Purpose Only